# “එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා” ණය යෝජනා ක්‍රමය

රජය මඟින් 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන රජයේ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය වේ. මෙම වැඩසටහන මඟින් නව ව්‍යවසායකයින් 100,000 ක් තෝරාගෙන ඔවුන් සවිබල ගැන්වීමට අපේක්ෂා කරන අතර දැනටමත් ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියුක්තව සිටින ව්‍යවසායකයින්ට තම ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා අතදීමටද අපේක්ෂා කෙරේ. ඒ තුළින් ශ්‍රී ලංකාව අපනයන වෙළෙඳාම මත පදනම් වූ ආර්ථිකයක් වෙත රැගෙන යාමට අවශ්‍ය ශක්තිය සහිත ව්‍යවසායකයින් පිරිසක් බිහි කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා සියලුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ආයෝජකයින් දිරිමත් කිරීම සඳහා එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන හරහා මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් සලසන යෝජනා ක්‍රම 21 ක් හඳුන්වා දී ඇත. මෙම ණය රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු මඟින් ක්‍රියාත්මක කෙරේ.

| අනු අංකය | ණය යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 01 | රන් අස්වැන්න | සුළු පරිමාණ ගොවීන් සහ ගොවි සංවිධාන, විසිතුරු මල් වගාකරුවන්, විසිතුරු මත්ස්‍ය වගාවේ නියැලෙන ව්‍යාපාරිකයන් |
| 02 | ගොවි නවෝදා | සුළු පරිමාණ ගොවීන් හා ගොවි සංවිධාන (කෘෂිකාර්මික කටයුතු යාන්ත්‍රීකරණය කිරීම) |
| 03 | රිය ශක්ති | පාසල් වෑන් රථ හිමියන් |
| 04 | සිටි රයිඩ් | පවතින පරණ බස් රථය වෙනුවට සුඛෝපභෝගී බස් රථ මිලට ගැනීමට කැමති පුද්ගලයන්,<br>ස්වකීය කාර්ය මණ්ඩලය වෙනුවෙන් වඩා සුවපහසු ප්‍රවාහන සේවාවන් සැපයීමට අදහස් කරන පිළිගත් සමාගම් |
| 05 | මිනි ටැක්සි | ත්‍රී රෝද රැකියාවේ නියුතු වූවන්ට ත්‍රී රෝද රථය වෙනුවට කුඩා මෝටර් රථ මිලදී ගැනීමට |
| 06 | රිවි බල සවි | සූර්ය බලශක්ති ඒකක සවි කිරීමට අපේක්ෂිත පෞද්ගලික නිවාස හිමියන් |
| 07 | දිරි සවිය | කුකුළු මස් නිෂ්පාකයින් හා ස්වයංජ රැකියාලාභීන් |
| 08 | ජය ඉසුර | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (කෘෂිකාර්මික, ධීවර, විසිතුරු මත්ස්‍ය වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ, සංචාරක, අත්කම්, දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, නිෂ්පාදන කර්මාන්ත සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍ර) |
| 09 | සොඳුරු පියස | තම නිවාස පුළුල් කර ගැනීමට හෝ සම්පූර්ණ තර ගැනීමට අපේක්ෂා කරන වර්ග අඩි 1,500 ට අඩු බිම් ප්‍රමාණයක් ඇති නිවාසහිමියන් |
| 10 | මාධ්‍ය අරුණ | ලියාපදිංචි මාධ්‍යවේදීන් |
| 11 | ශිෂ්‍ය | උසස් පෙළ සමත් වූවන් |
| 12 | ඇරඹුම | තරුණ උපාධිධරීන්/ NVQ 5,6,7 සහතිකලාභීන් |
| 13 | හරිත ණය | දිරාපත් වන අමුද්‍රව්‍ය යොදාගනිමින් භාණ්ඩ නිෂ්පාදය කරන්නන්, කුඩා පරිමාණ හෝටල් හිමියන්, කාබනික |

| | | |
|---|---|---|
| | සංචාරක නිවාස | පොහොර නිපදවන්නන්, ත්‍රී රෝද රථ හිමියන්ට මීටර් සවි කිරීමට<br><br>සංචාරක නිවාස පවත්වාගෙන යන්නන් |
| 14 | විකසිත නිවාස | මධ්‍යම ආදායම්ලාභීන් සඳහා |
| 15 | රැකවරණ | ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථාන |
| 16 | රටවිරු උපහාර | විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි විදේශ රැකියා නියුක්තිකයන් |
| 17 | වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන | පෞද්ගලික නිවාස හා ව්‍යවසායකයින් සඳහා |
| 18 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින් |
| 19 | පවිත්‍ර ගංගා | කැළණි ගඟට හා කලපු වලට අපද්‍රව්‍ය බැහැර කරන ව්‍යාපාර |
| 20 | ජාතික ණය සුරැකුම් ආයතනය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින් |
| 21 | සුළු හා මධ්‍ය පරිමාණ ආයතන පිහිටුවීමේ ණය වැඩසටහන | |

මේ සඳහා කැමති පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරි අංශයේ සංවර්ධන නිලධාරි (ව්‍යවසාය සංවර්ධන) හා සම්බන්ධ වන්න

# "තුරුණු දිරිය" තරුණ ව්‍යවසායකයින් සඳහා වන ණය යෝජනා ක්‍රමය

කුඩා පරිමාණ ව්‍යවසායකත්ව කටයුතු වල දැනටමත් නියැලි සිටිනා තරුණ ව්‍යවසායකයින්ට තම ව්‍යාපාර පුළුල් කර ගැනීමට හා ස්ථාවර කර ගැනීමට මූල්‍යමය සහායක් ලබා දීමේ අරමුණින් " තුරුණු දිරිය" නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ණය ක්‍රමය ,

- වයස අවු.40 ට අඩු තරුණ ව්‍යවසායකයින් සඳහා
- උපරිමය ලක්ෂ 5 ක් දක්වා ලබා දෙන අතර
- අයදුම්කරු උපාධියක්, ඩිප්ලෝමාවක්, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හෝ වෙනත් පිළිගත් තෘතියික මට්ටමේ සුදුසුකමකින් යුක්ත විය යුතුය.
- සහන පොලී අනුපාතයක් යටතේ ක්‍රියාත්මක වේ.

මේ සඳහා කැමති පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරි අංශයේ සංවර්ධන නිලධාරි (ව්‍යවසාය සංවර්ධන) හා සම්බන්ධ වන්න.